## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම 34:4-6, 8-9

නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.

**දයානුකම්පාවෙන් පූර්ණ මහා කාරුණික සහ විශ්වාසදායී දෙවියන් වහන්සේ.**

සමිඳාණන් වහන්සේ ඔහුට වදාළ පරිදි මෝසෙස් පළමු ඒවාට සමාන ගල් පුවරු දෙකක් කපා අලුයමින් නැගිට සීනයි කන්දට නැංගේ ය; ගල් පුවරු දෙක ද තම අතේ ගෙන ගියේ ය. සමිඳාණන් වහන්සේ ද වලාකුළක ආකාරයෙන් බැස, එහි ඔහු සමඟ සිටගෙන, 'සමිඳාණන් වහන්සේ' යන ස්වකීය නාමය ප්‍රකාශ කළ සේක. උන් වහන්සේ ඔහු ඉදිරියෙන් ගමන් කරමින්, "මම සමිඳාණන් වහන්සේ ය. මම දයානුකම්පාවෙන් පූර්ණ, වහා නොකිපෙන සුළු, මහා කාරුණික සහ විශ්වාසදායී දෙවියන් වහන්සේ ය; මෝසෙස් ද වහා බිමට හිස නමා නමස්කාර කෙළේ ය. ඉන්පසු ඔහු කතා කොට, සමිඳුනි, ඔබ ඉදිරියෙහි මම අනුග්‍රහය ලබා ඇත්තෙම් නම්, මාගේ සමිඳුන් වන ඔබ අප සමඟ වඩින ලෙස මම අයැද සිටිමි. මේ සෙනඟ නම් මුරණ්ඩු ය. අපේ දුෂ්ටකම හා පාප කමා කොට අප ඔබේ ම උරුමය වශයෙන් ගත මැනව"යි කී ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

(ද්වි. සම්. ග්‍ර) දානියෙල් 1:29-34

පිළිතුර: දෙවිඳුන්ගේ නාමයට සදාකාලයෙන් සදාකාලයට ප්‍රශංසා වේවා!

ගීය:
සමිඳුනි, අපේ පියවරුන්ගේ දෙවිඳුනි, ඔබ හට පැසසුම් වේ වා!
ඔබ වර්ණනා කරනු ලැබ සදහට ම ඔබ උසස් කරනු ලැබේ වා!
ඔබගේ මහිමාන්විත සුවිශුද්ධ නාමයට පැසසුම් වේ වා!
එය වර්ණනා කරනු ලැබ සදහට ම එය උසස් කරනු ලැබේ වා!
ඔබගේ තේජස් සම්පන්න දෙව්මැදුර තුළ ඔබ හට පැසසුම් වේ වා!
ඔබ උසස් කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ මහිමාන්විත කරනු ලැබේ වා!
ඔබගේ රාජ්‍යයේ සිහසුන අරා සිටින ඔබ හට පැසසුම් වේ වා!
ඔබ වර්ණනා කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ උසස් කරනු ලැබේ වා!
කෙරුබිම්වරුන්ට ඉහළින් වැඩ සිටින සහ සමුදුර මනින ඔබ හට පැසසුම් වේ වා!
ඔබ වර්ණනා කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ මහිමාන්විත වේ වා!
අහස් කුසයෙහි සිටින ඔබ හට පැසසුම් වේ වා!
ඔබ උසස් කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට මහිමාන්විත වේ වා!.

## **දෙවන දේව ප්‍රකාශනය** 2 කොරින්ති 13:11-14

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදය ද දෙවි පියාණන්ගේ ප්‍රේමය ද ශුද්ධාත්මයාණන්ගේ සහභාගිත්වය ද ඔබ සමඟ වේවා!.

ඉතින් සහෝදරවරුනි, ආයුබෝවන්. පරිපූර්ණත්වය සොයා යන්න; මාගේ අවවාද සිතට ගන්න; එක්සිත් වන්න; සාමදානයෙන් සිටින්න. එවිට ප්‍රේමාන්විත හා ශාන්තිදායක දෙවියන් වහන්සේ ඔබ සමඟ වැඩසිටින සේක. සාම සිඹීමකින් එකිනෙකාට ආචාර කරන්න. සියලු සැදැහැවත්හු ඔබට ආචාර කරති. ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කරුණාව ද දෙවියන් වහන්සේගේ ප්‍රේමය ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගිකම ද ඔබ සියල්ලන් සමඟ වේවා!

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## **සුබපුවත් ජය නද** එළිදරව්ව 1:8

ආලේලූයා! ආලේලූයා!
"ආරම්භය ද අවසානය ද මම වෙමි"යි වැඩ සිටින, වැඩ සිටිය, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමීන් වන දෙවියන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## **ශුද්ධවූ සුවිශේෂය** ජොහන් 3:16-18

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළ සේක්, එතුමණන් කරණකොටගෙන ලෝකයා ගළවනු ලබන පිණිස ය.**

"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලූ දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය. දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ, ලෝකයා විනිශ්චය කරන පිණිස නොව, උන් වහන්සේ කරණකොටගෙන ලෝකයා ගළවනු ලබන පිණිස ය. උන් වහන්සේ අදහාගන්නා විනිශ්චය කරනු නො ලැබේ. අදහා නොගන්නා දෙවියන් වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් අදහා නොගන්නා බැවින් දැනට ම විනිශ්චය ලබා ඇත.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.